අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

පිරිවෙන් අධ්‍යාපන අංශය
பிரிவெனாக்கள் கல்வி பிரிவு
Division of Piriven Education

4 වන මහල, ඉසුරුපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව / 4 வது மாடி, இசுருபாய, பத்தரமுல்ல, இலங்கை / 4th Floor,Isurupaya, Battaramulla, Sri Lanka
☎ +9411 278 5141 / +9411 278 4910 / +9411 278 4893 / +9411 278 4461 +9411 278 5617 / +9411 278 4992 info@piriven.gov.lk www.piriven.gov.lk

මගේ අංකය / எனது இல. / My Number: ED/ST/BUD/8/3/2/5/1
ඔබේ අංකය / உமது இல. / Your Number:
දිනය / திகதி / Date: 2022.06.26

සියලු ම කෘත්‍යාධිකාරී, පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලා හා
බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතන කෘත්‍යාධිකාරී/ ආයතනාධිපති සිල් මැණියන් වහන්සේලා වෙත.

**2022 ජුනි 27 වන සඳුදා සිට පිරිවෙන්වල අධ්‍යයන කටයුතු පවත්වාගෙන යාම පිළිබඳ උපදෙස්**

මාගේ අංක ED/ST/BUD/8/3/2/5/1 හා 2022.06.18 දාතමින් "2022 ජුනි 20 වන සඳුදා සිට පිරිවෙන්වල අධ්‍යයන කටයුතු පවත්වාගෙන යාම හා පවතින ප්‍රවාහන දුෂ්කරතා හේතුවෙන් ගුරු භවතුන්ට සහන සැලසීම" යන මැයෙන් නිකුත් කර ඇති ලිපියට වැඩිමනත් වශයෙනි.

02. මූලික, මහා පිරිවෙන් හා බෞද්ධ සීලමාතා පිරිවෙන්වල අධ්‍යාපන කටයුතු බහුතරයක් නේවාසික සිසුන්ගේ සහභාගිත්වයෙන් සිදු වන බැවින් මවිසින් නිකුත් කර ඇති උක්ත උපදෙස් ලිපිය අනුව තවදුරටත් කටයුතු කරන මෙන් කාරුණික ව දන්වා සිටිමි.

03. විද්‍යායතන පිරිවෙන්වල අධ්‍යාපන කටයුතු සම්බන්ධයෙන් එම විද්‍යායතන පිරිවෙන පිහිටා ඇති ප්‍රදේශයේ ආසන්නතම රජයේ පාසල පවත්වා ගැනීම සඳහා අනුගමන කරන ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම වඩාත් යෝග්‍ය වේ.

04. ඉගෙනුම ලබන සිසුන්ගේ අධ්‍යාපන මට්ටම බිඳ වැටීමට ඉඩ නොතබා සියලු ම පිරිවෙන් හා බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතන පවත්වා ගැනීමට පරිවේණාධිපති ස්වාමීන් වහන්සේ / ආයතනාධිපති සිල් මැණියන් වහන්සේ හා ආචාර්ය මණ්ඩලය සමග ද අවශ්‍ය නම් භාරකරුවන් / දෙමව්පියන් සමග ද සාකච්ඡා කොට තීරණ ගැනීමට කෘත්‍යාධිකාරී ස්වාමීන් වහන්සේට / සිල් මැණියන් වහන්සේට මෙයින් බලය පැවරේ.

05. කෙසේ නමුදු පවතින ඉන්ධන අර්බුදය හේතුවෙන් ප්‍රවාහන දුෂ්කරතාවලට මුහුණ පා සිටින අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයට සහන සැලසීම කෘත්‍යාධිකාරී ස්වාමීන් වහන්සේගේ / සිල් මැණියන් වහන්සේගේ වගකීමක් බව ද ඔවුන් වෙතින් ලැබෙන ඉල්ලීම් සම්බන්ධයෙන් සානුකම්පිත ව කටයුතු කරන ලෙස ද මෙයින් කාරුණික ව සිහිපත් කරන අතර පිරිවෙන පවත්වා ගැනීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණ හා අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ලොග් සටහන් තැබිය යුතු බව ද අදාළ ලේඛන ඇතුළත් ලිපි ගොනුවක් පවත්වා ගත යුතු බව ද කාරුණික ව දන්වා සිටිමි.

06. මෙම අසීරු අවස්ථාවේ දී සිසුන්ගේ ඉගෙනුම් අවස්ථා තහවුරු කොට ගුණ නැණ පිරි ශක්තිමත් ප්‍රජාවක් පිරිවෙන් අධ්‍යාපනය තුළින් අනාගතයට දායාද කරනු පිණිස කටයුතු කිරීම අතිශයින් ම අගය කරමි.

වටිනාපහ සෝමානන්ද හිමි,
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන ලේකම් වෙනුවට

**පිටපත් :**

01. අතිරේක ලේකම් (පාලන / සංවර්ධන) - පිරිවෙන් අධ්‍යාපන අංශය
02. සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
03. සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
04. සියලු ම අංශ හා පළාත් භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) හිමිවරුන්
05. සියලු ම පිරිවෙන් කොට්ඨාස භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) හිමිවරුන්
06. සියලු ම විෂය භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) හිමිවරුන් හා මහත්වරුන්
07. සියලු ම පිරිවෙන් ගුරු උපදේශක මහත්වරුන් හා හිමිවරුන්

(01–07) කාරු. දැ.ගැ.පි / අ.ක.ස.

08. ගොනුවට